# රත්නපුර ප්‍රාදේශිය සභාවේ 2022.02.21 වන දින මහා සභා රැස්වීම් වාර්තාව

රත්නපුර ප්‍රාදේශිය සභාවේ මහා සභා රැස්වීම 2022.02.21 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක මහතා | ගරු සභාපති |
| 02. | ජී.ජී.ජානක පුෂ්ප කුමාර මහතා | ගරු උප සභාපති |
| 03. | ටී.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 04. | එන්.විජය ශ්‍රී ශාන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 05. | ජී.එච්.රංජිත් ධර්මකීර්ති මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 06. | අයි.වී.අකිල රෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 07. | කේ.රණවක කළුආරච්චි මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 08. | ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 09. | පී.වී.ඉසුරු ජයලත් විතාරණ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 10 | ඒ.එම්.සමන් පාලිත විජේරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 11. | එම්.ඒ.ඩික්සන් ජයතිලක මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 12. | කේ.නිරෝෂන් ලක්මාල් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 13. | ආර්.බී.නාලක සුදත් ශ්‍රී හේමපාල මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 14. | ටී.ජී.ඉන්ද්‍රාණි මැණිකේ මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 15. | කේ.ඒ.ජයරත්න මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 16. | පී.වී.ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 17. | ජී.වී.අනුෂ විරාජ් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 18. | එල්.එම්.තමරා සුභාෂිණී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 19. | කේ.වී.කමනි සේනාධීර මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 20. | ගෝපාල් තම්බිරාජා මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 21. | බී.ඒ.ලලිත් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 22. | පී.රොහාන් ශ්‍රියන්ත කුමාර මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 23. | මංජුල ශ්‍රීලාල් බී ගමගේ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 24. | කේ.ජී. නිහාල් අමරසිංහ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 25. | ඒ.දොන්.නිශාන් දමිත්අල්ගම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 26. | පී.උදය කුමාර් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 27. | ජී.ජී.ලිලානි චන්ද්‍රතිලක මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 28. | යූ.කේ.නන්දාවතී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 29. | ආර්.ඒ.පත්මා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 30. | එම්.වජිරා නන්දනී මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 31. | ඩී.නිලන්ති දීපිකා යසරත්න මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 32. | ජී.අනුර ප්‍රභාත් අමරවංශ මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 33. | ඒ.එම්.නිලන්ති මහත්මිය | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලා

| | | |
|---|---|---|
| 01. | බී.ප්‍රියන්ත මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 02. | ඕ.කේ.සුගත් ජයවික්‍රම මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |
| 03. | රාමසාමි මෝහන සුන්දරම් මහතා | ගරු ප්‍රා/ස/මන්ත්‍රී |

**සහභාගී වූ නිලධාරීන් :-**

**01.**කේ.අජිත් දයානන්ද මහතා - ලේකම්

**02.**ජී.එච්.අයි.ඩී.ආරියමිත්‍ර මහත්මිය - සංවර්ධන නිලධාරී

**01.පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.01.19 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බව සමන් පාලිත මහතා විසින් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම.**

නැත

**04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න**

නැත

**05.යථා පරිදි කල් දී ඇති යෝජනා**

i. 2021 වර්ෂයේ අවසන් ගිණුම් වාර්තාව අනුමත කිරීම සඳහා සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී අඛිල රෝෂන් ලක්මාල් මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලද අතර, ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත මහතා මේ සඳහා විරෝධය ප්‍රකාශ කළේය.

ii. අංක 05, මල්වල පාසැළ අසළ,මල්වල රත්නපුර ලිපිනයැති බී.ජී.ධර්මසේන මහතාගේ ඇසට කාචයක් දැමීම සඳහා රු:-5000.00ක ආධාර මුදලක් ලබාදීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතියට ඉදිරිපත් කර , ලබාදීම දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ධර්ම කීර්ති මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iii. ඕළුගල මාර්ගයේ ඇප තැන්පත් සඳහා තැන්පත් කරන ලද රු:-50000.00ක මුදල මුදලින් රු:-1774.00ක මුදලක් ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 04 වගන්තිය යටතේ දැන්වීම් භාෂා පරිවර්තන ගාස්තු වශයෙන් ගෙවා ඇති මුදල අඩුකර ඉතිරිය වන රු:-48226.00ක මුදල ආපසු ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.ඒ අනුව මීට පෙර සභාවකදී උක්ත මාර්ගය අත්පත් කර ගැනීමට මෙම සභාව විසින් ගන්නා ලද තිරණය අවලංගු වන බවත් සඳහන් කරන ලදී. එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

iv. රත්නපුර ප්‍රාදේශීය සභාවේ වැඩක්ෂේත්‍ර කම්කරු තනතුර සඳහා ඒ.තිළිණි රසිකා කුමාරි මෙනවිය සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරනු ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

v. 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා සිදුකරනු ලැබූ භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව ඉදිරිපත් කරන ලද අවසන් වාර්තාව සඳහා මහා සභාවේ අනමුතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී නාලක සුදත් ශ්‍රී හේමපාල මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

vi. රත්නපුර දිසා අධිකරණ නඩු අංක 23145/ඉඩම් දරණ කෙම්පනාවත්ත සිට වලකඩවත්ත දක්වා පාර ඉදිකිරීම නඩුවේ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව රු:-391,755.00ක මුදලක් විත්තිකරුවන් විසින් පැමිණිලි කාරියට ගෙවීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මහා සභාවට ඉදිරිපත් කරන ලදුව, මෙම කාරණාව පොදු කටයුත්තක් බැවින් හිටපු ගරු සභාපතිතුමා විසින් මෙම මුදල් සභා අරමුදලින් ගෙවීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක්ද මහා සභාවට ඉදිරිපත් කරන ලදී. මෙම නඩුවේ තීන්දුව ප්‍රකාරව හා සභා අරමුදලින් ගෙවීමට ඇති ප්‍රතිපාදන පිළිබඳව විමසා බලා තිරණයක් ලබා ගැනීම සුදුසු බව මහා සභාවේ තීරණය කරන ලදී.

vii. රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ මාසික මහා සභා රැස්වීම් පැවැත්වීම සෑම මසකම දෙවන සතියේ සිකුරාදා දින යොදා ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී විජය ශ්‍රී ශාන්ත මහතා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව,ගරු මන්ත්‍රී අනුෂ විරාජ් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

## 06.කාරක සභාවල වාර්තා

2022.01.31 දින පැවති මුදල් කාරක සභාව අනුමත කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු මන්ත්‍රී ටී.ප්‍රේමතිලක මහතාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලද අතර, එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කණ්ඩායම මෙම වාර්තාව අනුමත කිරීමට විරෝධය එල කරන ලදී.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

මාසික ආදායම් හා වියදම් සාරාංශ වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

## 08.ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ කතා

### i. ගරු උප සභාපති ජී.ජී. ජානක පුෂ්ප කුමාර මහතා

මත්ද්‍රව්‍ය වුවදුර සම්බන්ධයෙන් මම ගියවර සභාවේ දී කතා කළා ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකරලා නියෝජ්‍ය පොලිස්පති, රත්නපුර පොලිසියේ පොලිස් පරීක්ෂක තුමා හා සිරිපාගම , වේවැල්වත්ත පොලීසියේ ස්ථානාධිපතිවරුන් හා සුරාබදු අධිකාරියේ නිලධාරීන්ද කැඳවා සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ගෞරවනීය ස්තූතිය පුද කර සිටින බවත්, මේ සාකච්ඡාවෙන් පසුව මෙම මත්ද්‍රව්‍ය වුවදුර මැඩලීම සඳහා අවශ්‍ය කටයුතු සිදුවී තිබෙන බවත්, මේ වන විට සිදුකරන ලද වැටලීම් තුළින් අප නොදන්නා තොරතුරු සොයාගෙන තිබෙනවා මේ සම්බන්ධයෙන් පොලීසියේ හා සුරාබදු අධිකාරියේ සියළුම නිලධාරීන්ටද ස්තූතිය ප්‍රකාශ කරන අතර, ප්‍රදේශයෙන් මත්ද්‍රව්‍ය දුරුලීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සඳහා මේ වන විට කමිටුවක් පත්කරගෙන තිබෙනවා ඒ සඳහා ද පැමිණෙන ලෙස සියළුම දෙනාගෙන් ඉල්ලා සිටින බව එතුමා පැවසුවේය. මේ තුළින් දරුවන්ගේ අනාගතය මත්ද්‍රව්‍ය වුවදුර හේතුවෙන් විනාශ නොවීමට කටයුතු කිරීම සඳහා පියවර ගත හැකි යැයිද එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

පසුගිය පෙබරවාරි 4 වනදා 74 වන නිදහස් දිනය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නිදහස් චතුරශ්‍රයේදී ජාතික උත්සවය සමරන වේලාවේදී සබරගමුව පළාතේ උත්සවය රත්නපුර දිස්ත්‍රික්කයේත් සැමරුවා , ඔබතුමාට ආරාධනා කර තිබුනා ඒ වගේම ගරු ආණ්ඩුකාරතුමා විසින් සියළුම මන්ත්‍රීවරුන්ට ද ආරාධනා කරන ලෙසට දිස්ත්‍රික් ලේකම් තුමිය වෙත දැනුම් දීලා තිබෙනවා දිස්ත්‍රික් ලේකම් තුමිය සියළුම නිලධාරීන්ට ආරාධනා කරලා මහජන නියෝජිතයින් සියළුම දෙනා එයින් ඉවත් කර තිබෙනවා. මේ පිළිබඳව සභාවක් හැටියට දැඩි විරෝධය එල කර සිටින බවත්, මෙම නිදහස් සැමරුම ආපසු සමරන්නට බැහැ නමුත් ඉදිරියට මෙවැනි කටයුතු සිදුනොවීමට වග බලා ගතයුතු බවත් මහජන නියෝජිතයින්ට හිමි ගෞරවය ලබාදෙන ලෙසත් එතුමා පැවසුවේය. 75 වන නිදහස් සමරුවටවත් ආරාධනා කිරීමට කටයුතු කරන ලෙස ගරු උප සභාපතිතුමා පැවසුවේය.

### ii. ගරු මන්ත්‍රී රොහාන් ශ්‍රියන්ත කුමාර් මහතා

මගේ කොට්ඨාශයේ ගලබඩ වත්තේ ගල්කඳුර කොටසේ රාජේන්ද්‍රන් නැමති වතු කම්කරුවාට ඉඩම් කොටසක් වත්තෙන් ලැබී තිබෙනවා ඔහු එහි නිවසක් සාදාගෙන ජීවත් වනවා , පාසැල් යන වයසේ පසුවන දරුවන් දෙදෙනෙකුද සිටින මොහු ජීවත් වීම සඳහා බිම්මල් ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා .මේ සඳහා ලියාපදිංචි සහතිකය ලබා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කළත් එය ලබාදෙන්නේ නැහැ, වතු අධිකාරි වරයාගේ කැමැත්ත අවශ්‍ය බව පවසනවා . වතු අධිකාරීවරයා විසින් මෙම පුද්ගලයා මෙම වත්තේ ස්ථිර පදිංචි කරුවෙකු ලෙස ලපියක් නිකුත් කරනවා එය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළත් එය ප්‍රමාණවත් නොවන බව සඳහන් කරනවා මේ කරුණ හේතුවෙන් මෙම පුද්ගලයාට මෙම ව්‍යාපාරය කරගෙන යාම සඳහා ලියාපදිංචිය ලැබෙන්නේ නැහැ. නමුත් නීත්‍යානුකූලව තමන්ට හිමි පර්චස් 7 කොටසේ පදිංචි වී සිටින්නේ ලයින් කාමරවල රැදී සිටින පුද්ගලයෙකුට මෙය සිදුවුවානම් සාධාරණ බවත් පැවසු එතුමා කියා සිටියේ මෙවැනි කටයුතු වෙනුවෙන් දේශපාලන අධිකාරියේ මැදිහත් වීම තුළින් විසඳුම් ලබා ගැනීමට කටයුතු කළයුතු බවයි. මේ යෝජනාව ප්‍රාදේ ශිය සම්බන්ධිකරණයටත් යොමුකරන බවත්, ඊට එහායින් යන දිස්ත්‍රික් සම්බන්ධීකරණය වැනි රැස්වීම වලදී ඔබතුමා මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙසද එතුමා සඳහන් කළේය.

ගලබඩ ප්‍රදේශයේ නායයෑමකට ලක්වනු ඇතැයි අපේක්ෂා කර එම ප්‍රදේශවලින් ඉවත් කළ පිරිසට තවමත් ඉවම් නොලැබුණු බවත්, මේ පිළිබඳව පසුගිය අයවැය විවාදයේදී ඉදිරිත් කිරීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන ලියනගේ මැතිතුමා වෙත දැනුම් දුන්නා එතුමා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේදී කතා කළ එම අවස්ථාවේදී ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා ක්ෂණිකව පිළිතුරක් ලබා දෙමින් කියා

සිටියේ මේ සම්බන්ධව ප්‍රාදේශීය සමබන්ධිකරණයේ අනුමැතිය ලබාගෙන තමන් වෙත එවන ලෙසත් , අදාල වතු සමාගම් සමඟ සාකච්ඡා කර කඩිනමින් විසඳුමක් ලබාදෙන ලෙස පවසා තිබූ බව එතුමා සඳහන් කළේය. එතුමාට ගෞරවනීය ස්තුතිය පුදකරන බවත්, මෙම කාරණාව පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධිකරණයට ගරු සභාපතිතුමාගේ යෝජනාවක් ලෙස ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ගරු ඇමතිතුමාවෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කළේය.

සභා රැස්වීමට පැමිණි විට සභාවේ සාකච්ඡා කරන සියළුම දේට සාවධානව ඇහුම්කන් දෙන අතර, මම බොහෝ විට අදහස් ප්‍රකාශ කරන්නේ බොහෝ මන්ත්‍රීවරුන් පිරිසකගේ අදහස් වලින් පසුවයි. මන්ද නවක මන්ත්‍රීවරුන් ලෙස ජ්‍යෙෂ්ඨයින්ගේ අදහස් ලබාගත යුතු බැවින් , නමුත් මෙලෝ රහක් නැතුව අර්ථයක් නොමැතිව තප්පුලන කතා නම් අහන්න සූදානම් නොමැති බව එතුමා පැවසුවේය . තමන් මන්ත්‍රී ධූරයට අමතරව රාජ්‍ය මූල්‍ය ආයතනයක ප්‍රාදේශීය කාර්යාලයක ප්‍රධානියා හැටියට කටයුතු කරන බැවින් තමන්ට කාලය ඉතා වැදගත් යැයි එතුමා පැවසුවේය. එම නිසා තමන්ගේ අදහස් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඇතැම් අවස්ථාවලදී සභාවෙන් පිටවී යන්නේ ගරු සභාපතිතුමාගේ අවසරය ඇතිව බවත් රාජකාරී කටයුතු බොහෝ තිබෙන නිසාත් බව එතුමා පැවසුවේය.

### iii. ගරු මන්ත්‍රී අනුර ප්‍රභාත් අමරවංශ මහතා

පියාණන්ගේ අභාවය වෙනුවෙන් දැනුවත් වූ මන්ත්‍රීවරුන් පැමිණ අවසන් ගෞරව දැක්වීම සඳහා පැමිණීම සම්බන්ධයෙන් තම ගෞරවය ස්තුතිය එල කර සිටින බව එතුමා ප්‍රකාශ කළේය. ගියවර සභාවේදී ශාන්ත මන්ත්‍රී තුමා හා ගරු සභාපතිතුමා ශෝකය ප්‍රකාශ කර තිබුණා එතුමාලාටත් ස්තුතිවන්ත වන බව පැවසුවේය.

ඉළුක්වත් රත්තුරුගල මාර්ගය ඉතා අබලන් තත්වයට පත්ව ඇති බවත්, සභාවෙන් ප්‍රිමික්ස් අංගනය නැවතත් ආරම්භ කළහොත් මෙම මාර්ග පිළිසකර කර ගැනීමේ හැකියාවක් ඇති වන බව එතුමා සඳහන් කළේය.

රොහාන් මන්ත්‍රීතුමා සඳහන් කළ වතු කම්කරුවන්ගේ ගැටළු ප්‍රාදේශීය සම්බන්ධිකරණයට ඉදිරිපත් කර වතු සමාගම් දැනුවත් කළ යුතු බවද , ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු වලදී සාකච්ඡා කිරීම තුළින් වතු සමාගම් වලට විශාල බලපෑමක් ඇති කළ හැකි බවද එතුමා සඳහන් කළේය.

රටේ තත්වය පිළිබඳව කතා කළොත් පක්ෂ භේදයකින් තොරව ජනතා විමුක්ති පෙරමුණ පිළබඳව සාකච්ඡාවක් ඇති වී තිබෙන බවත්, ගම් මට්ටමින් තම පක්ෂයේ දැනුවත් කිරීම මේ දිනවල සිදුකරමින් පවතින බවද එතුමා සඳහන් කළේය.

### iv. ගරු මන්ත්‍රී ඊ.කේ.ජී.ප්‍රියන්ත පෙරේරා මහතා

මෙවර නිදහස් උත්සවයට මහජන නියෝජිතයින් සඳහා ආරාධනා නොකිරීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් තුමිය වෙත මන්ත්‍රීවරයෙකු ලෙස දැඩි විරෝධය එල කර සිටින බව එතුමා ප්‍රකාශ කළේය. මහජන නියෝජිතයින් ඒ සඳහා සහභාගී වීමට අවස්ථාව සළසා දිය යුතු බව එතුමා වැඩි දුරටත් සඳහන් කළේය.

රත්ගඟ ශ්‍රී පලාබද්දල මාර්ගය මේ වන විට අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතිනවා ඇතැම් අවස්ථාවලදී මාර්ගයේ වැඩ කරන විට ඇතැම් නිවාස වලට ආරක්ෂිත බැම් සකස් කර තිබෙනවා ඇතැම් නිවාස වලට බැම් සකස් කර නැහැ. ඒ තැන්වල බැම් කපා තිබුණත් ඉදිකිරීම සිදුකර නැහැ මේ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් දැනුවත් කරනු ලැබූවද ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බැවින් මේ අයුරින් අසාධාරණයට ලක් වූ පිරිස පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දී අවශ්‍ය පියවර ගතයුතු බව එතුමා සඳහන් කළේය.

කුඩා විදුලි බලාගාර පිළිබඳව කතා කළ යුතුයි. මගේ කොට්ඨාශයේ විශාල වශයෙන් ගංඟා රාශියක් තිබෙන ප්‍රදේශයක්,ඊයෙ වන විට අරුණෝදි ප්‍රයිවට් ලිමටඩ් යන කුඩා විදුලි බලාගාරයට ජලය නොමැති බව පවසමින් පොල් අතු ගහ ජල මාර්ග වෙනස් කර රත්ගඟට ගෙන ඒමට කටතු කිරීම සඳහා මැණුම් කටයුතු කර තිබුණා මේ පිළිබඳව දේශපාලන අධිකාරියේ දැනුවත් කිරීමක් නොමැති බවද එතුමා පැවසුවේය. කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් දැනුවත් වීමකින් තොරව ප්‍රාෙදේශීය සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට හෝ ඔවුන් කටයුතු කිරීමට හැකියාවක් ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙස එතුමා පැවසුවේය.

රත්ගඟ රත්නපුර මාර්ගයේ ගමන් කිරීමේදී රත්ගඟ සිට රත්නපුර දක්වා කිලෝමීටර් 23යි තිබෙන්නේ නමුත් බස් ගාස්තු වශයෙන් රු120.00ක් අය කරනවා තෙල් මිළ වැඩි වීමත් සමඟ මෙය සිදු වූවත් වැඩි වන බස් ගාස්තුව හේතුවෙන් ජනතාව දිනෙන් දින අපහසුතාවයට පත්වන බව එතුමා සඳහන් කළේය. මෙම මුදලින් රත්නපුර සිට හෝමාගම දක්වා ගමන් කළ හැකි බවද එතුමා වැඩිදුරටත් සඳහන් කළේය. එහි

සංශෝධනයක් සිදුකරන ලෙසට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟ සාකච්ඡා කර කටයුතු කරමුයැයි ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළේය.

**v. ගරු මන්ත්‍රී ලලිත් බෝතුංග ආරච්චි මහතා**

සිරිපාගම මාර්ගය සකස් කිරීමේදී එක් එක් අයට වෙනස් ආකාරයට සලකන බවද ඇතැම් අයට විශාල බැම් කෝටි ගණන් වියදම් කර සකස් කර දී ඇති බවත්, අසරණ මිනිසුන්ට නොසළකා ඇති බවත් එතුමා සඳහන් කළ අතර, මාර්ග සංවර්ධන අධිකාරිය පට්ට හොරු රැළක් සිටින ස්ථානයක් බවත් තමන්ගේ අදහස බව එතුමා පැවසුවේය. මැණික් මුදලාලිට නොයෙකුත් තනතුරු තිබෙන අයට බැම් සකස් කර තිබෙනවා.ආදාඇල්ලේ ඩයස් කියන මහත්තයාගේ නිවස ඉදිරිපිට පොඩි ටැංකියක් තිබුණා වතුර බොන්න එය ගලවා තිබෙනවා.එතන තිබෙන ඉඩම ඇදී ඇදී පහළට එනවා මේ පිළිබඳව දැනුම් දුන්නා ගල් ටිකක් තබා හෝ මෙම ඉඩම කඩා වැටීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසට නමුත් එය සිදුවූයේ නැහැ සම්බන්ධිකරණ කමිටුවේදීත් මේ පිළිබඳව අදහස් දක්වනවා මේ පිළිබඳව ගරු ආණ්ඩුකාර තුමාගේ අවධානයටද යොමු කරන ලෙසත්, මෙම ස්ථානයට ආණ්ඩුකාර තුමාගේ නිලධාරියෙකු හෝ යවා අදාල ස්ථානය පරීක්ෂා කිරීමට කටයුතු කර විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කළ අතර, මෙය සාධාරණ ඉල්ලීමක් බව එතුමා සඳහන් කළේය.

ඇතැම් නායනෑමට ලක්ව ඇති ස්ථානවල අයට නව නගරයෙන් ඉඩම් ලබා දුන්නා එම ඉඩම් ලබාගෙන ඒවා විකුණා නැවතත් අදාල ස්ථානයේම පදිංචි වී සිටින පිරිසගේ නිවෙස් වලට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බැම් සකස් කර දීම සිදුකර තිබෙනවා. රජයේ මෙසේ කටයුතු කිරීම සාධාරනද යන්න එතුමා විමසීමක් කළේය.

අපේ කණ්ඩායමේ ප්‍රශ්ණයක් මෙය සභාවට පැමිණ එහි රැදී නොසිට අත්සන් තැබීමට අවස්ථාව ලබාදෙන්න බැහැ. ඔබගේ කණ්ඩායමේ අයට එවැනි අවස්ථා ලබා දුන්නාට තමන්ගේ විරෝධයක් නොමැති බවත් එතුමා ප්‍රකාශ කළේය.

**vi. ගරු මන්ත්‍රී ඉන්දික ලක්ෂ්මන් විතාරම මහතා**

රොහාන් මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කළ දේවල් පිළිගත් නමුත් ජාතිවාදයට යොමු වෙන කතා කීම පිළිබඳව තම අප්‍රසාදය එල කරන බව එතුමා පැවසුවේය. වතු කරයේ ජනතාවට පත්ව ඇති තත්වය කණගාටු දායකයි. නමුත් සිංහල දෙමළ භේදයක් නැහැ රොහාන් මන්ත්‍රීතුමා පැවසූ පරිදි දෙමළ නිසා අසාධාරණයට ලක්වනවාද යන්න කීම පිළිබඳව තම විරෝධය එල කර සිටින බව එතුමා සඳහන් කළේය.

මෙවර අයවැය ජයග්‍රහණය කළ බවත්, මුදල් දී ලබා ගැනීමට අවශ්‍ය නොමැති බවත් තම කණ්ඩායම එකට සිට කටයුතු කළ බවත් එතුමා සඳහන් කළේය.

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයා ප්‍රකාශ කළා තම පක්ෂයේ වැඩ පිළිවෙළක් තිබෙනවා එය ජයග්‍රහණය කරා ගෙන යන බවත්, නමුත් 88/89 කාලයේ සිදුවුනු දේවල් පිළිබඳව තමන්ට මතක් වූ බවද එතුමා සඳහන් කළේය.

රොහාන් මන්ත්‍රීතුමාට අවශ්‍ය තම ජනතාවගේ ප්‍රශ්ණ එලෙසින්ම තියාගෙන එම ඡන්ද වලින් ජයග්‍රහනය කිරීම බවත්, කොට්ඨාශයට ලක්ෂ 40ක් ලබා දී තිබියදීත් ඒවායින් කුමක් සිදුකරනවාද යන්න එතුමා විමසීමක් කළේය. ජනතාවට අවශය පහසුකම් එම මුදල් වලින් සැකසිය හැකි බවද එතුමා සඳහන් කළේය.

**vii. ගරු සභාපතිතුමා**

අද දින මහා සභාවට පැමිණි සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් කාර්යය මණ්ඩලයේ සියළුම දෙනාටත් ස්තුති වන්ත වෙමින් තම අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරමින් සභාවේ කටයුතුද අවසන් කරන ලදී.

ඩබ්ලිව්.ඩී.සුදත් දිසානායක,
සභාපති,
රත්නපුර ප්‍රාදේශිය සභාව